00240

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තුමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව- 6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2022/2023

**LLU6715 - කම්කරු නීතිය**

කාලය - පැය එකයි

---

දිනය - 27.09.2023 වේලාව - ප.ව 3.30 - ප.ව 4.30

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. CFK පුද්ගලික සමාගම කොළඹ ස්ථාපිත වූ දිවයින පුරා ශාඛා විහිදී ගිය සුප්‍රසිද්ධ ආපන ශාලා ජාලයකි. අසිත 2021 ජනවාරි මාසයේ සිට CFK රාජගිරිය අලෙවිසැලෙහි බෙදාහැරීමේ නියෝජිතයෙකු ලෙස සේවය කරනු ලබයි. CFK සමාගම සහ ඔහු අතර වූ එකඟතාවට අනුව ඔහු ප.ව 4.30 සිට ප.ව 10.30 දක්වා වූ කාලය තුළ CFK අලෙවිසැලේ සිට පාරිභෝගිකයින් දැනුම්දෙන ස්ථාන කරා ආහාර බෙදා හැරීම අවශ්‍ය වේ. උදය කාලයේදී ඔහුට වෙනත් කාර්යයන්හි යෙදීමට ඉඩ ලබා දී ඇති නමුත් ඔහු ප.ව 4.00 ට වැඩට වාර්තා කළ යුතුය. බෙදාහැරීමේ සේවාවන් සඳහා අසිත තමාගේම මෝටර් බයිසිකලය භාවිතා කරයි. සමාගමේ ලාංඡනය මෝටර් බයිසිකලයේ සවි කර ඇත. මෝටර් බයිසිකලයේ ඉන්ධන සහ නඩත්තුව සඳහා සමාගම විසින් ගෙවනු ලබයි. සමාගම විසින් ලබා දුන් ආහාර බෙදා හැරීමේ ඇසුරුම ද ඔහු භාවිතා කරයි. ආහාර බෙදා හරින වේලාවේදී අසිත CFK නිල ඇඳුම ඇඳ සිටීම අවශ්‍ය වේ. ආපන ශාලාවේ අනෙකුත් සේවකයින් දිනපතා අත්සන් කරනු ලබන පැමිණීමේ ලේඛණය අසිත අත්සන් නොකරයි. තම කාර්යයන් තුන් වන පාර්ශවයක් වෙත පැවරීමට අසිතට ඉඩ ලබා දී නොමැත.

   මෑතකදී, CFK ආහාර බෙදාහරිමින් සිටියදී අසිත අනතුරකට මුහුණ පෑවේය. ඔහු අනතුර වෙනුවෙන් සමාගමෙන් වන්දි ඉල්ලා සිටියේය. කෙසේවෙතත් අසිත සමාගමේ සේවකයෙකු නොවේ යන පදනම මත සමාගම ඔහුට වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කරඇත.

   තමා සමාගමේ සේවකයෙක්ද නැතහොත් ස්වාධීන ගිවිසුම්කරුවෙක්ද යන්න සම්බන්ධයෙන් අසිත ඔබගේ උපදෙස් විමසා සිටී. අදාළ නෛතික අධිකාරීන් දක්වමින් අසිතට උපදෙස් දෙන්න.

   (ලකුණු 20)

2. "පරිවාසික සේවකයින් සම්බන්ධ පොදු මූලධර්මය වන්නේ සේවායෝජකයාට සේවය අවසන් කිරීමේ අයිතිය පවතී යන්නයි. සේවකයාට සේවායෝජකයාගේ අසද්භාවය ඔප්පු කළ හැකි අවස්ථාව මෙම රීතියට ඇති එකම ව්‍යතිරේඛය වේ."
   *- Egalahewa. S, A General Guide to Sri Lanka Labour Law, (2018, 1st edition, Stamford Lake Pvt.Ltd,) p. 529*
   ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද?
   අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩුතීන්දු ඇසුරින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

   (ලකුණු 20)

*-හිමිකම් ඇවිරිණි-*